රෙජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්:
பணிப்பாளர் நாயகம் பதிவாளர் இல } 011-2864483
Director Genaral/Registrar
අධ්‍යක්ෂ
பணிப்பாளர் } 011-2888424
Director
සහකාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர் } 0112884612
Asst. Director
කාර්යාලය
அலுவலகம் } 011 -2877376
Office
ෆැක්ස් :
தொலை நகல் } 011-2884612
Fax

මගේ අංකය
எனது இல } VSSO/NGO/REG/Circular/01
My No.

ඔබේ අංකය
உமது இல }
Your No.

දිනය
திகதி } 25.04.2024
Date

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය-14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල.**
அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் – 14ஆம் மாடி சுஹுருபாய பத்தரமுல்ல.
**National Secretariat for Non-governmental Organizations - 14th Floor, Suhurupaya,Battaramulla.**
විද්‍යුත් තැපැල්/மின் அஞ்சல்E-mail:ngosecretariat.gov@gmail.com

සියළුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීම.</u>**

ඔබ දන්නා පරිදි, 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය හා අධීක්ෂණය) පනතේ 02 වගන්තියේ (03) හා (04) වන උප වගන්ති ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් පිලිවෙලින් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් හා සහකාර රෙජිස්ට්‍රාර් ලෙස දැනටමත් ක්‍රියා කරයි.

02) ඒ අනුව නව සංවිධානලියාපදිංචි කිරීමේදී පහත උපදෙස් අනුව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

i. **සාමාජික සුභසාධන සංවිධාන**
සංවිධානයේ ප්‍රධාන අරමුණ සාමාජික සුභසාධනය වන සංවිධාන (විදේශ අරමුදල් නොලබන) දිවයිනපුරා සාමාජිකයන් විසිර සිටියද සංවිධානය ස්ථාපිතව ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියාපදිංචි කල යුතුයි

ii. **නව සංවිධානය ලියාපදිංචි කිරීම.**
අළුතින් පිහිටුවා ගන්නා ලද සංවිධානයක් නම් ලියාපදිංචි කිරීමේදී එක් වසරක ක්‍රියාකාරීත්වය සලකා බැලීම හා මූල්‍ය වාර්තා ලබාගැනීම අවශ්‍ය නොවේ.

iii. **සාමාජිකත්වය සහ නිලතල**
සාමාජිකත්වය සහ නිලතල එක් පවුලකට සීමා නොවිය යුතුය. ප්‍රධාන නිලතල සඳහා එකම පවුලේ සාමාජිකයින් දෙදෙනෙකුට වඩා පත්නොවිය යුතුය. (මේ සඳහා එකම පවුලේ සාමාජිකයන් ලෙස කලත්‍රයා, දරුවන්, දෙමව්පියන් සහ සහෝදර සහෝදරියන් අයත්වේ.)

03) දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් පිළිවෙලින් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් සහ සහකාර රෙජිස්ට්‍රාර් ලෙස කටයුතු කරන හෙයින් රාජ්‍ය නොවන සංවිධානවල තනතුරු නොදැරිය යුතුය. සංවිධානයන්හි ව්‍යවස්ථාව මඟින් නිලබලයෙන් තනතුරුවලට පත්කර ඇත්නම් ඔබ වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම පහසුකිරීම සඳහා එම ව්‍යවස්ථා සංශෝධනය කර එම තනතුරුවලින් නිදහස්වීම සුදුසුය.

04) මෙම උපදෙස් මීට පෙර මෙම ලේකම් කාර්යාලයෙන් නිකුත් කර තිබෙන චක්‍රලේඛ වලට අමතර වශයෙන් බව කාරුණිකව දන්වා සිටිමි.

සංජීව විමලගුණරත්න,
අධ්‍යක්ෂ ජනරාල්/ ලේඛකාධිකාරී

පිටපත්-සියළුම දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරකවරු වෙත.